# විදුර විද්‍යාලය - කොළඹ

4 වන ශ්‍රේණිය

සිංහල භාෂාව

- දුවේ පුතේ, පහත සඳහන් ශිෂ්‍ය සටහන් ඔබේ සිංහල ලිවීම පොතට පිටපත් කරන්න.

## පෞද්ගලික ලිපි

ශිෂ්‍ය සටහන 01

ආකෘතිය

ස්ථානය

දිනය

ආශිර්වාදය

ආමන්ත්‍රණය

කරුණු ලිවීම........................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................

අවසානය

අභ්‍යාසය

ඔබත් පවුලේ අයත් ඉදිරියේ දී යාමට බලාපොරොත්තු වන විනෝද ගමනකට ඔබේ යහළුවෙක් / යෙහෙළියක් සහභාගී කර ගැනීමට කැමැත්ත විමසමින් යවන ලිපියක් ලියන්න.

ශිෂ්‍ය සටහන 02

නිවසේදී

2021-04-02

සෙත් වේවා !

මා හිතවත් පසිඳු වෙත,

ඔබගේ සැපදුක් කෙසේද? මම සුවෙන් සිටිනවා. ඔබගේ අම්මා, තාත්තා සහ අක්කා ද සුවෙන් ඇතැයි සිතනවා.

අගෝස්තු නිවාඩු කාලය ලැබුණු පසු, මම ඔබගේ නිවසට පැමිණෙන්නම්. එවිට අපට සෙල්ලම් කිරීමට හැකි වේවි. ඔබේ ගමේ ඇවිදීමට ද මම ආශාවෙන් සිටිනවා. මා පැමිණෙන දිනය ඔබට පසු ව දන්වා එවන්නම්.

ඔබගේ පවුලේ සැම මතක් කළ බව පවසන්න.

ඔබ සැමට තෙරුවන් සරණයි !

හිතවත් මිතුරා

දෙනුවන්

අභ්‍යාස

01. මෙම ලිපිය ලියන්නේ කුමන ස්ථානයක සිටද?

..............................................................................................................

02. ලිපියේ සඳහන් ආශිර්වාදය කුමක්ද?

..............................................................................................................

03. දෙනුවන් පසිඳුගේ නිවසට පැමිණෙන්නේ කුමන මාසයේද?

..............................................................................................................

04. මෙම ලිපිය ලියා ඇති දිනය ලියන්න.

..............................................................................................................